• සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2017** | **06 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை2017** | **தரம்06**
**Third Term Test 2017** | **Grade06**

**බුද්ධ ධර්මය - I කොටස**

**කාලය :-** **පැය දෙකයි**
***Two hours***

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බුදුවන්නට කාලය පැමිණ ඇතැයි බෝසතාණන්ට ආරාධනා කළේ,

   1. ශක්‍ර දේවේන්ද්‍රයා     2. සහම්පති මහා බ්‍රහ්මයා     3. අසිත තාපසයා

2. සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ ගුරුවරයා වන්නේ,

   1. කොණ්ඩඤ්ඤ බමුණා     2. වප්ප බමුණා     3. සර්වමිත්‍ර බමුණා

3. සිදුහත් කුමරු ගිහිගෙය අතහැර යාම මහාභිනිෂ්ක්‍රමණය ලෙස හැඳින්වේ. එවිට එතුමාගේ වයස,

   1. අවුඃ 29     2. අවුඃ 31     3. අවුඃ 27

4. සද්ධාය සම්පදින්නේන යන ගාථාව මගින් කියවෙන්නේ,

   1. මල් පූජා කිරීමය
   2. පහන් පූජා කිරීමය
   3. පැන් පූජා කිරීමය

5. බුදු දහමේ සඳහන් පරිදි මෙත් වැඩීමේ අනුසස් ගණන,

   1. 8 කි     2. 11 කි     3. 12 කි

6. රාහුල කුමරුන්ව පැවිදි කරවන ලෙස බුදුරදුන් දැනුම් දුන්නේ,
    1. සැරියුත් මහරහතන් වහන්සේටයි
    2. ආනන්ද තෙරුන්ටයි
    3. කාශ්‍යප මහ රහතන් වහන්සේටයි

7. අලීනතාවය යනුවෙන් දහමේ සඳහන් වන්නේ,
    1. ශීලාචාරකම
    2. කම්මැලි නැති කම
    3. ණය නැති කම

8. ශීලය සම්පූර්ණ විමට කළ යුත්ත කිරිම බුදු දහමේ සඳහන් වෙන්නේ,
    1. විරතිය යනුවෙනි
    2. විරමනය යනුවෙනි
    3. සමාදානය යනුවෙනි

9. වචනයෙන් සිදුවන අකුසලයක් වන්නේ,
    1. බොරු කීම
    2. ඇත්ත කථා කීම
    3. කේළාම් නොකීම

10. දෙමව්පියෝ දරුවන්ගේ හොඳ නරක හා ඔවුන්ගේ ක්‍රියා දෙස මැදිහත් සිතින් බලති.  මෙය හැඳින්වෙන්නේ
    1. උපේක්ඛා නමිනි
    2. කරුණා නමිනි
    3. මෙත්තා නමිනි

11. මඝ මානවක ඇතුලු පිරිස අත බලවත් වූ ඖෂධයක් ඇතැයි සැකයක් ඉපදුනේ
    1. උදේන රජු
    2. මගධ රජු
    3. කොසොල් රජු

12. ශ්‍රී ලංකාවේ ජාතික ගීයේ නිර්මාතෘවරයා ලෙසින් හැඳින්වූයේ

1. මහගමසේකර මහතා
2. පණ්ඩිත් අමරදේව මහතා
3. ආනන්ද සමරකෝන් මහතා

13. බුදුන් වහන්සේ රාහුල හිමියන්ට දේශනා කළේ

1. ආදිත්ත පරියාය සූත්‍රය
2. අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය
3. අනත්ත ලක්ඛන සූත්‍රය

14. ලොව පවතින පණ ඇති පණ නැති සෑම දෙයක්ම වෙනස් වීමට යටත් වේ මෙම ප්‍රකාශය

1. අසත්‍ය වේ
2. සත්‍ය වේ
3. කිසිවක් කිව නොහැක

15. සබ්බේ සං ජීවිතං පියං යන ගාථා පාඨයේ තේරුම වන්නේ

1. සියලලෝම දඬුවමින් තැති ගනිති
2. සියල්ලෝම මරණයට බියවෙති
3. සියල්ලෝම ජීවිතයට ප්‍රියවෙති

16. ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ

1. ජූනි 05 2. ජූලි 04 3. ඔක් 01

17. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමෙන් අනතුරුව ඉදි වූ ප්‍රථම ස්ථූපය වන්නේ

1. අම්බස්තලය චෛත්‍යය
2. මිරිසවැටිය චෛත්‍යය
3. ථූපාරාම චෛත්‍යය

18. මහානාග යුවරජුගේ බිරිඳ වූයේ

1. සෝමා දේවිය
2. අනුලා දේවිය
3. විහාර මහා දේවිය

19. සිත තුළ පැහැදීමකින් තොරව ඇති කර ගන්නා ශ්‍රද්ධාව

1. ආකාරවතී ශ්‍රද්ධාව
2. අමූලිකා ශ්‍රද්ධාව
3. මෛත්‍රිය

20. දැඩි තෘෂ්ණාවෙන් විනාශය ළඟා වේ මේ බව පසක් කරන ජාතක කථාව වන්නේ

1. චුල්ල ධනුද්ධර ජාතකය
2. ස්වර්ණ හංස ජාතකය
3. නන්දිවිසාල ජාතකය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Educationසබරගමුව

**තෙවන වාර පරීක්ෂණය 2017** — **06 ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை **2017** — **தரம் 06**
**STecond Term Test 2017** — **Grade 06**

**බුද්ධ ධර්මය - II කොටස**

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 **පහත සඳහන් ප්‍රකාශ හරිනම් (✔) ලකුණද වැරදි නම් (×) වැරදි ලකුණද යොදන්න.**

i. සිදුහත් කුමරුගේ සිඟිති දෙපා අසිත තවුසාගේ දෙපා මත පිහිටියේය. ( )

ii. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා, යනු සතර සංග්‍රහ වස්තු වේ. ( )

iii. සිදුහත් බෝසතාණෝ දුෂ්කර තපස් ව්‍රත අතහැර දමා මැදුම් පිළිවෙත අනුගමනය කළහ. ( )

iv. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව ධම්ම චක්ක පවත්වන සූත්‍රයයි. ( )

v. සිදුහත් කුමරා ඉපදී සත් දිනකින් මහාමායා දේවිය කලුරිය කළාය. ( )

vi. සිදුහත් තවුසාණන්ට උද්දකරාම පුත්ත තවුසාණන් වෙතින් නව අරමුණු ඉටුකර ගැනීමට හැකිවිය ( )

vii. බුද්ධත්වය පතා බෝමුල කරා යන බෝසතාණන්ට හග්ගව තවුසා කුස තණ මිටි අටක් දුන්නේය ( )

viii. සත් හැවිරිදි රාහුල කුමරුවෝ බුදුන් සමීපයට ගොස් උනවහන්සේ සතු ධනය ඉල්ලා සිටියහ ( )

ix. බුදුන් වහන්සේ නතං කම්මං කහං සාධු යන ගාථාව දේශනා කළේ සුමන මල් තෙරුණ්ගේ උතුම් ක්‍රියාව මුල් කරගෙනය ( )

x. බුදුන් වහන්සේ බොහෝ විට පරිසරයෙන් ඈත්ව කල් ගෙවූහ ( )

(02) I පංචශීලයට අයත් සිල්පද දෙකක් ලියන්න

II කයින් වන අකුසල් තුන ලියන්න.

III පන්සිල් රැකිමෙන් සමාජයට වන යහපත් ප්‍රතිඵල 05 ක් ලියන්න.

(03) I සිදුහත් කුමරුගේ සංසුන් බව දැක මහත් සතුටට පත්ව නිබ්බුත පද ප්‍රකාශ කළේ කවුද?

II නිබ්බුත පද ලියන්න

III එහි තේරුම ලියන්න

(04) I ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න

II චෛත්‍ය වදින ගාථාව ලියන්න.

III පහත වචන වලට අදාළ ශාසනික වචන ලියන්න.

1. අතුගානවා
2. නිදාගන්නවා
3. කනවා
4. යනවා
5. බුලත්විට

(05) I අපේ රටේ ප්‍රධානතම ජාතික සංකේත 02 ක් ලියන්න.

II ජාතික කොඩියෙහි ඇතුළත් සංකේත 03 ක් නම් කර ඉන් ප්‍රකාශිත අර්ථයද කෙටියෙන් ලියන්න.

III ජාතික කොඩිය පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු 05 ක් ලියන්න.

(06) I පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න

II ඔබේ ගෙවත්ත පිරිසිදුව තබා ගැනීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න

III බුදුන් වහන්සේ ගස්වැල් ආරක්ෂා කිරීමේ වැදගත්කම පෙන්වා දුන් බවට උදාහරණ 02 ක් ලියන්න

(07) I ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම හැඳින්වීමට වෙනත් නමක් ලියන්න.

II උඳුවප් පොහොය ශ්‍රී ලාංකික බෞද්ධයන්ට ශාසනික වශයෙන් වැදගත් වන කරුණු 02 ක් ලියන්න.

III බෝධි පූජාවන් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු වතාවත් 05 ක් ලියන්න.